මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம்,கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2021 – 02 - 01

# 2020 තුන් වැනි කාර්තුව සඳහා වන ජාතික ගිණුම් ඇස්තමේන්තුව

**2019 තුන් වැනි කාර්තුවට සාපේක්ෂව**
**විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සුවිශේෂී වර්ධනයක්**

විදුලි සංදේශ සේවාවන්හි 16.5%ක වර්ධනයක් සමග 2020 වසරේ තෙවැනි කාර්තුවේ සේවා අංශය පෙර වසරේ එම කාර්තුවට සාපේක්ෂව 2.1% වර්ධනයක් අත් කරගෙන තිබේ. එම කාලය තුළ විදුලි සංදේශ සේවා 16.5%ක වර්ධනයක් අත් කරගෙන ඇත්තේ එහි සමස්ත ආදායම රුපියල් බිලියන 48ක් ලෙස වාර්තා කරමිනි. මෙම කාර්තුව තුළ දී තාක්ෂණ සේවාවන් 13.5%ක වර්ධනයක් අත් කර ගෙන තිබේ. කොවිඩ් වසංගතය හමුවේ පාසල් දරුවන් නිවසේ සිට අධ්‍යාපන කටයුතුවල නිරතවීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ රාජකාරි කටයුතු සඳහා සහභාගී වීම මෙම තත්ත්වයට හේතු වී ඇත.

2020 වසරේ තුන් වැනි කාර්තුව සඳහා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති ජාතික ගිණුම් ඇස්තමේන්තු මගින් මෙම තොරතුරු අනාවරණ කර ඇත. ඒ අනුව මූල්‍ය සේවාවන් 12.3%ක වර්ධනයක් අත් කරගෙන තිබේ. පෙර වසරේ එම කාර්තුව සඳහා ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 179,848ක් ලෙස වාර්තා වූ මූල්‍ය සේවා සැපයීම 2020 තෙවැනි කාර්තුවේ දී රුපියල් මිලියන 202,023ක් ලෙස වාර්තා වී තිබේ. එම කාර්තුවේ දී ණය අත්තිකාරම් වටිනාකම්වල 13.8%ක සහ මුළු තැන්පතු වටිනාකම්වල 18.5%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

විශේෂ වර්ධනයක් අත් කර ගෙන ඇති තවත් ක්ෂේත්‍රයක් වන්නේ තැපැල් සේවාවයි. තැපැල් සහ සෞඛ්‍ය සේවාවන් පිළිවෙළින් 7%ක සහ 4.6%ක වර්ධනයක් හිමි කරගෙන ඇති අතර දේපළ වෙළෙඳාම් සේවය 3.1%ක වර්ධනයක් අත් කර ගෙන ඇත.

කොරෝනා පළමු රැල්ලෙන් පසු ජන ජීවිතය සාමාන්‍යකරණයට පත්වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළෙඳාම ද සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය වී ඇත. 2019 වසරේ තෙවැනි කාර්තුවේ දී ඊට පෙර වසරේ එම කාර්තුවට සාපේක්ෂව 2.1%ක වර්ධනයක් අත් කර ගත් තොග හා සිල්ලර වෙළෙඳාම මෙම වසරේ තුන් වැනි කාර්තුවේ දී තවදුරටත් 2.9%ක වර්ධනයක් වාර්තා කර ඇත.

2020 තෙවැනි කාර්තුවේ දී මුහුදු සහ ගුවන් ප්‍රවාහන කටයුතු සෘණ වර්ධනයන් වාර්තා කළ ද ගොඩබිම් ප්‍රවාහනය ධන වර්ධනයක් වාර්තා කර තිබේ. එම කාලය තුළ

සමස්ත ප්‍රවාහන සේවා 0.9%ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මීට අමතරව රාජ්‍ය පරිපාලනය, වෘත්තීය සේවා, සහ අධ්‍යාපන සේවා යන ආර්ථික කටයුතු ද මෙම කාර්තුවේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කෙසේ වෙතත් පැවැති කොවිඩ්- 19 වසංගත තත්ත්වය හේතුවෙන් නවාතැන් සහ ආහාරපාන සැපයීම 2020 තෙවැනි කාර්තුවේ දී තවදුරටත් 42.1%ක පසුබෑමක් වාර්තා කර තිබේ.

මෙම කාලය තුළ දී සේවා අංශය මගින් දළ දේශීය නිෂ්පාදිතය සඳහා ලබා දී ඇති දායකත්වය 56.8%කි.



අසේල බණ්ඩාරනායක,
ගරු මුදල් අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්